සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**89 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
**General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)**

| | | |
|---|---|---|
| **නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය** | **I, II** | *පැය තුනයි* |
| வடிவமைப்பும் இயந்திரத் தொழிட்பவியலும் | **I, II** | *மூன்று மணித்தியாலம்* |
| Design and Mechanical Technology | **I, II** | *Three hours* |

**අමතර කියවීම් කාලය** - **මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය I

*උපදෙස්:*

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** පහත සඳහන් සංකේත අතුරෙන් තෙවන කෝණ සෘජු ප්‍රක්ෂේපණ ක්‍රමයට අදාළ සංකේතය කුමක් ද?


(1)


(2)


(3)


(4)

**2.** පහත විකසන රූප අතුරෙන් චතුස්තලයක විකසනය දැක්වෙන්නේ කවර රූපයක ද?


(1)


(2)


(3)


(4)

**3.** සම්මත ක්‍රම අනුගමනය කර සෘජු ප්‍රක්ෂේපණ චිත්‍ර ඇඳීමේදී නිතර ම අදාළ වස්තුවේ ඉදිරි පෙනුම,
(1) සැලැස්මට උඩින් හෝ යටින් ඇඳිය යුතු ය.
(2) සැලැස්මට පැත්තෙන් පමණක් ඇඳිය යුතු ය.
(3) සැලැස්මට උඩින් පමණක් ඇඳිය යුතු ය.
(4) සැලැස්මට යටින් පමණක් ඇඳිය යුතු ය.

4. යම්කිසි වස්තුවකට අදාළ වන සේ ඇඳි ඉදිරි පෙනුම චිත්‍රයක් පහත රූපයේ දැක්වේ.



ඉහත රූපයේ සැලැස්ම සම්මත රේඛා සමග ඇඳි විට එය නිරූපණය වන්නේ පහත කවර රූපයකින් ද?



(1) (2) (3) (4)

5. වෘත්ත පරිධියක බාහිර ලක්ෂ්‍යයක සිට එම වෘත්තයට ඇඳිය හැකි ස්පර්ශක ගණන,
(1) එකකි. (2) දෙකකි. (3) තුනකි. (4) තුන්සිය හැටකි.

6. කිසියම් අරයකින් අඳින ලද වෘත්තයක පරිධිය එම අරයෙන් ම කවකටුවකින් ඡේදනය කරන්නේ නම්, එම වෘත්ත පරිධිය ස්ථාන කීයකින් ඡේදනය වේ ද?
(1) දෙකයි (2) හතරයි (3) හයයි (4) අටයි

7. ඉංජිනේරු දඬු අඬුවක භාවිත කරන චලිත පරිවර්තන උපක්‍රමය සඳහන් වරණය කුමක් ද?
(1) රේඛීය චලිතය → අනුවැටුම චලිතය
(2) චක්‍රීය චලිතය → රේඛීය චලිතය
(3) දෝලන චලිතය → රේඛීය චලිතය
(4) චක්‍රීය චලිතය → දෝලන චලිතය

8. රෙදි මහන යන්ත්‍රයක් ක්‍රියාත්මක කිරීමේදී පාදිකයේ සිදුවන චලිතය කුමක් ද?
(1) දෝලන චලිතය (2) භ්‍රමණ චලිතය (3) රේඛීය චලිතය (4) අනුවැටුම චලිතය

9. 'ඇඳුම් දඬු' භාවිත කර ජවය සම්ප්‍රේෂණය කරනුයේ පහත සඳහන් කුමන උපාංගය ආශ්‍රිතව ද?
(1) මගී බස් රථයක යාන්ත්‍රික සීනුව (2) පාපැදියේ පාදිකය
(3) වාහන සම්ප්‍රේෂණ පද්ධතියේ අවර පෙති කඳ (4) වාහන එන්ජිමක කැම් දණ්ඩ

10. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **වැරදි** ප්‍රකාශය කුමක් ද?
(1) වාත්තු කිරීමේදී උණු කරන ලෝහයේ සුවිකාර්යතා ගුණය ඉතා වැදගත් ය.
(2) ගිනි නිවීමේදී ගිනි ත්‍රිකෝණයේ එක් සාධකයක් ඉවත් කළ ද ගින්න නිවී යයි.
(3) වීනච්චට්ටි ලෝහයේ භංගුරතා ගුණය ඉතා ඉහළ ය.
(4) සර්පිලාකාර දුන්නක ප්‍රත්‍යාස්ථතා ගුණය පවතී.

11. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ක්‍රමානුකූලභාවය පවත්වාගෙන යාම සඳහා කර්මාන්තශාලාවකට සංවිධාන සැලැස්මක් අවශ්‍ය නොවේ.
(2) තෙල් ගිනි නිවීම සඳහා කලු පැහැති ගිනි නිවීමේ උපකරණ භාවිත කළ හැකි ය.
(3) පුද්ගලයෙක් ඉහළකින් වැටීම නිසා අභ්‍යන්තර රුධිර වහනයක් සිදු නොවිය හැකි ය.
(4) තද අයිස් ස්පර්ශ වීමෙන් සමේ පිළිස්සීම් සිදු නොවේ.

12. පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) මැග්නිටෝවක අධිවෝල්ටීයතාවක් නිපදවීමේදී පරිපථ බිඳීමක් සිදු නොවේ.
(2) මැග්නිටෝවක මෘදු යකඩ මාධ්‍ය දෙකක් මත ජ්වලන ආමේචර දෙකක් ඔතා ඇත.
(3) මැග්නිටෝවක ප්‍රාථමික දඟරයේ කම්බියේ විෂ්කම්භයට වඩා ද්විතීය දඟරයේ කම්බියේ විෂ්කම්භය අඩු ය.
(4) මැග්නිටෝවක ද්විතීය දඟරයේ පොටවල් ගණන වැඩි වන විට එහි ප්‍රේරිත විද්‍යුත් ගාමක බලය අඩු ය.

13. තාප නිනාල සංසරණ සිසිලන ක්‍රමයේදී,
(1) සිසිලන වරල් අවශ්‍ය නොවේ. (2) ජල පොම්පයක් භාවිත කරයි.
(3) උණුසුම් ජලය ජල කුහර තුළ පවතී. (4) විශාල විකිරකයක් අවශ්‍ය වේ.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**14.** සැහැල්ලු මෝටර් රථවල ප්‍රත්‍යාවර්තකය සහ සිසිලන පංකාව ක්‍රියා කිරීම සඳහා භාවිත කර ඇති පටි (Belt) වර්ගය කුමක් ද?
(1) පැතලි පටි (2) 'V' පටි (3) දත් සහිත පටි (4) රවුම් පටි

**15.** පෙට්‍රල් ඉන්ධන භාවිත කරන කුඩා විදුලි ජනක යන්ත්‍ර සඳහා බහුලව යොදාගෙන ඇති සිසිලන ක්‍රමය කුමක් ද?
(1) පුඹුකය (blower) සහිත වාත සිසිලන ක්‍රමය
(2) තාප නිනාල ජල සිසිලන ක්‍රමය
(3) ජල පොම්පය සහිත ජල සිසිලන ක්‍රමය
(4) පුඹුකය රහිත වාත සිසිලන ක්‍රමය

**16.** ජව සම්ප්‍රේෂණ පද්ධතියක එළවන (drive) රෝදයේ දැති ගණන, එළවෙන (driven) රෝදයේ දැති ගණනට වඩා අඩු වූ විට, එළවෙන රෝදයේ,
(1) වේගය වැඩි ය, ව්‍යාවර්තය අඩු ය.
(2) වේගය අඩු ය, ව්‍යාවර්තය වැඩි ය.
(3) වේගය අඩු ය, ව්‍යාවර්තය අඩු ය.
(4) වේගය වැඩි ය, ව්‍යාවර්තය වැඩි ය.

**17.** පහත සඳහන් ලෝහ තහඩු වර්ග අතුරෙන්, ආලේපිත ලෝහ තහඩු වර්ගය කුමක් ද?
(1) මල නොකන වානේ තහඩු (2) ඇලුමිනියම් තහඩු
(3) පිත්තල තහඩු (4) ගැල්වනයිස් තහඩු

**18.** ඉංජිනේරු මිටිය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) මිටියක් වර්ග වන්නේ එහි පෙත්තේ හැඩය අනුව ය.
(2) මිටියක හිස චීනච්චට්ටි ලෝහයෙන් නිපදවා ඇත.
(3) බර 100 g – 500 g දක්වා මිටි කුළු ගෙඩි ලෙස හඳුන්වයි.
(4) මිටිය භාවිතයේදී සෑමවිට ම මිටේ මැදින් අල්ලාගත යුතු ය.

**19.** බාල්දියක පතුලේ වාටිය සකසා ගැනීමට භාවිත කළ යුතු සට්ටම් වර්ගය වන්නේ,
(1) පුනීල සට්ටමයි. (2) පුලුක්කු සට්ටමයි. (3) වටඅඩි සට්ටමයි. (4) වටඔළු සට්ටමයි.

**20.** ලෝහ භාණ්ඩයක් නිමහම් කර ඔප දැමීමේ ක්‍රමයක් වන 'ඔක්සිඩයිස්' කිරීම අර්ථ දක්වා ඇති වරණය කුමක් ද?
(1) උණුසුම් කළ ලෝහය මත තුත්තනාගම් ආලේප කිරීම.
(2) රත් කළ ලෝහ භාණ්ඩය වර්ණ සහිත උණුසුම් දියර තෙල් බඳුනක ගිල්වීම.
(3) විශේෂිත වූ කුටීර තුළ තබා පුයර ආලේප කිරීම.
(4) රත් කළ ලෝහය මත එනමල් වර්ණ ආලේප කිරීම.

**21.** වාත සිසිලන පද්ධතියක පුඹුකය මගින් ලැබෙන ප්‍රයෝජනය වන්නේ,
(1) එන්ජිමේ සිසිලන වරල් වෙත ලැබෙන වාතය වේගවත් කිරීමයි.
(2) සිසිලන වාතය සමග මිශ්‍ර වී ඇති අපද්‍රව්‍ය හා දූවිලි ඉවත් කිරීමයි.
(3) අනවශ්‍ය ස්ථානවලට වාතය ලබාදීම වැළැක්වීමයි.
(4) එන්ජිමෙන් ඉවත් නොවන තාපයෙන් හානි සිදුවීම වැළැක්වීමයි.

**22.** ඔක්සි ඇසිටිලීන් වායු භාවිත කර සිදු කරන පිත්තල ලෝහය පෑස්සීමකදී එහි වෙල්ඩින් ධමනි පහන් සකස් කර ගත යුතු දැල්ල කුමක් ද?
(1) කාබන්කාරක දැල්ල (2) උදාසීන දැල්ල
(3) ඔක්සිකාරක දැල්ල (4) ඇසිටිලීන් දැල්ල

**23.** ඔක්සි ඇසිටිලීන් වායු පෑස්සීමට අදාළ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ඝනකම 3 mm තහඩු පෑස්සීමේදී සුරත් වෙල්ඩින් ක්‍රමය භාවිත කරයි.
(2) කාබයිට් කැට යොදා වායු නිපදවාගෙන භාවිත කරන වායු වෙල්ඩින් කට්ටලයක අධි පීඩන ධමනි පහන භාවිත වේ.
(3) ඇසිටිලීන් සිලින්ඩරයට පීඩන ආමානය සවි වන්නේ දකුණත් ඉස්කුරුප්පු පොටකිනි.
(4) ඔක්සි ඇසිටිලීන් පෑස්සීම බාහිර ලෝහ කූරක් යොදාගෙන වුවද සිදු කළ හැකි ය.

**24.** ස්නේහන තෙල්වල දුස්ස්‍රාවිතාව මැනීමට භාවිත කරන උපකරණය කුමක් ද?
(1) පිපෙට්ටුව (2) හයිඩ්‍රොමීටරය
(3) මල්ටිමීටරය (4) සේබෝල්ට් විස්කොමීටරය

**25.** පුළිඟු පේනුවක 'වා' පරතරය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ස්පර්ශක ආමානය මගින් පරීක්ෂා කරයි
(2) වර්නියර් කලපාසය මගින් පරීක්ෂා කරයි
(3) මුහුණත් ආමානය මගින් පරීක්ෂා කරයි
(4) මයික්‍රොමීටරය මගින් පරීක්ෂා කරයි

**26.** වෙල්ඩින් කිරීම වඩාත් හොඳින් පැහැදිලි කරන වරණය කුමක් ද?
(1) ෆෙරස්, නිෆෙරස් ලෝහ කොටස් දෙකක් ෆෙරස් වර්ගයේ ලෝහ කූරක් සමග, විදුලි චාපයක තාපය මගින් ද්‍රව කර සම්බන්ධ කිරීම.
(2) එකම වර්ගයේ ලෝහ කොටස් දෙකක් වෙනත් වර්ගයක ලෝහ කූරක් සමග එකට රත්කර සම්බන්ධ කිරීම.
(3) එකම වර්ගයේ නොවන ලෝහ කොටස් දෙකක් වෙනත් වර්ගයක ලෝහ කූරක් සමග විදුලිය මගින් ද්‍රව කර ගලා යාමට සලස්වා සම්බන්ධ කිරීම.
(4) එකම වර්ගයේ ලෝහ කොටස් දෙකක් එම වර්ගයේ ම ලෝහ කූරක් සමග විදුලි චාපයක තාපය මගින් ද්‍රව කර සම්බන්ධ කිරීම

**27.** එන්ජිමක් තුළ ස්නේහන තෙල් මගින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යය කුමක් ද?
(1) ඝර්ෂණය අවම කිරීම
(2) කම්පන වාරකයක් ලෙස ක්‍රියා කිරීම
(3) සිසිලන කාරකයක් ලෙස ක්‍රියා කිරීම
(4) විඛාදන නිවාරකයක් ලෙස ක්‍රියා කිරීම

**28.** යකඩ ලෝහය ඉතා සුළු වශයෙන් හෝ අඩංගු නැති ලෝහය වන්නේ,
(1) ඊනච්චට්ටි ය. (2) සිද්ධ යකඩ ය. (3) තුත්තනාගම් ය. (4) මෘදු වානේ ය.

**29.** නවීන මෝටර් රථ සඳහා LED වර්ගයේ පහන් යොදාගනු ලබන්නේ කුමන හේතුවක් නිසා ද?
(1) විදුලි පද්ධතිය සරලව නිර්මාණය කර ගැනීමට
(2) පහසුවෙන් බැටරිය ආරෝපණය කර ගැනීමට
(3) බැටරියේ ආයු කාලය වැඩි කර ගැනීමට
(4) අලංකාරවත් ආලෝක රටා නිර්මාණය කර ගැනීමට

**30.** පුළිඟු පේනුවට ලැබෙන අධි වෝල්ටීයතාව කාන්දු නොවීමට පුළිඟු පේනුවේ මධ්‍ය ඉලෙක්ට්‍රෝඩය වටා යොදන පරිවාරකය සඳහා සුදුසු අමුද්‍රව්‍ය කුමක් ද?
(1) බේක්ලයිට් (2) කැන්වස් (3) ප්ලාස්ටික් (4) පෝසිලේන්

**31.** එක්තරා යතුරුපැදියක් ක්‍රියාත්මක කර සුළු වේලාවකින් එහි නලාව නාද කිරීමට හැකි වූ අතර ඉන්පසු එන්ජිම නතර කර සුළු වේලාවකට පසු නලාව ඉතාම සෙමින් නාද වී තවදුරටත් නාදවීම සිදු නොවී ය. මේ තත්ත්වයට ආසන්නතම හේතුව කුමක් ද?
(1) මැග්නිටෝ ජනකය දෝෂ සහිත වීම
(2) සෘජුකාරක ස්ථායි ඒකකය දෝෂ සහිත වීම (R/R unit)
(3) බැටරිය දෝෂ සහිත වීම
(4) නලාව දෝෂ සහිත වීම

**32.** ලේපිත රහිත පෑස්සුම් කූරක් භාවිත කර නිෆෙරස් ලෝහ වෙල්ඩින් කිරීම සඳහා වඩාත් ම යෝග්‍ය උපකරණය කුමක් ද?
(1) සරල ධාරා පරිණාමකය (2) ප්‍රත්‍යාවර්තන ධාරා පරිණාමකය
(3) ඔක්සි ඇසිටිලීන් පන්දම (4) ධමනි පහන සමග කෙටේරි බච්චය

**33.** ලෝහ හඳුනාගැනීම සඳහා සිදු කරන ගිනිමල් පරීක්ෂණයේදී ගිනිමල්වල ස්වභාවය වෙනස් වීමට බලපාන සාධකය කුමක් ද?
(1) ලෝහයේ වර්ණය (2) ලෝහයේ ඝනකම
(3) ගැටෙන විට හඬ (4) මෘදු බව හා දැඩි බව

**34.** ගියර පෙට්ටි හා ආන්තර කට්ටලවලට යොදනු ලබන ස්නේහන තෙල් හඳුන්වන අංක පිළිවෙළින් කවරේ ද?
(1) SAE 10 හා SAE 20 (2) SAE 30 හා SAE 40
(3) SAE 40 හා SAE 90 (4) SAE 90 හා SAE 140

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**35.** අඟල් $\frac{1}{16}$ ඝනකමින් යුත් පිත්තල තහඩුවක් සෘජු රේඛාවක් දිගේ කපාගැනීමට සුදුසු ආවුදය වන්නේ,

(1) කපන කටුවයි. (2) උදුතල කතුරයි. (3) බංකු කතුරයි. (4) ලෝහ කියතයි.

**36.** මෙම රූපයෙන් දැක්වෙන්නේ,

(1) නැමි වාටියකි.
(2) වාමි වාටියකි.
(3) උඩ එතුම් වාටි මූට්ටුවකි.
(4) හක්කා මූට්ටුවකි.



**37.** වාහන වර්ණ ගැන්වීමේදී දෙවන ආලේපය සඳහා තීන්ත සහ තිනර් මිශ්‍ර කර ගන්නා අනුපාතය කවරේ ද?

(1) $1:1$ (2) $1:1\frac{1}{2}$ (3) $1:2$ (4) $1:2\frac{1}{2}$

**38.** කර්මාන්තශාලා සංවිධාන සැලසුමේ ඉහළ ම තනතුරු තුන පිළිවෙළින් සඳහන් වන්නේ කුමන වරණයේ ද?

(1) කොටස්කරුවන්, අධ්‍යක්ෂවරුන්, කළමනාකාර අධ්‍යක්ෂ
(2) කොටස්කරුවන්, කළමනාකාර අධ්‍යක්ෂ, අධ්‍යක්ෂවරුන්
(3) කළමනාකාර අධ්‍යක්ෂ, කොටස්කරුවන්, අධ්‍යක්ෂවරුන්
(4) කළමනාකාර අධ්‍යක්ෂ, අධ්‍යක්ෂවරුන්, කොටස්කරුවන්

**39.** ආවුද මුවහත් තැබීමේදී $87^\circ$ ක කැපුම් කෝණයක් තබන්නේ කුමන ආවුදයේ ද?

(1) තහඩු කතුර (2) පැතලි කපන කටුව
(3) ඇඹරුම් විදුම් කටුව (4) රූවිත කපන කටුව

**40.** තෙවන පන්තියේ ලීවර ක්‍රමය සහිත උපකරණ/මෙවලම් පමණක් අඩංගු වරණය තෝරන්න.

(1) බිලී පිත්ත සහ වීල්බැරෝව (2) ගිරය සහ සවල
(3) බිලී පිත්ත සහ ඉදල (4) ගිරය සහ කතුර

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

89 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය I, II
வடிவமைப்பும் இயந்திரத் தொழிட்பவியலும் I, II
Design and Mechanical Technology I, II

## නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) වස්තුවක සමාංශක රූපයක් පහත ඉදිරිපත් කර ඇත.




(සියලු මිනුම් මිලිමීටරවලිනි.)

මෙම සමාංශක රූපය ආධාර කරගෙන

(1) *A* ඊතලය දෙසින් බලා ඉදිරි පෙනුම ද
(2) *B* ඊතලය දෙසින් බලා පැති පෙනුම ද
(3) *C* ඊතලය දෙසින් බලා සැලැස්ම ද

දී ඇති මිනුම් අනුව 1:1 පරිමාණයට තෙවන කෝණ සජු ප්‍රක්ෂේපණ ක්‍රමය අනුගමනය කරමින් අඳින්න.

(ii) අරය 40 mm ක් වූ වෘත්තයක් ඇඳ එහි පරිධිය සමාන කොටස් පහකට (05) බෙදන්න. (නිර්මාණ රේඛා පැහැදිලිව තිබීම අත්‍යවශ්‍ය වේ.)

PAST PAPERS WIKI

[හත්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



**2.** පාසල් තාක්ෂණ ඒකකය සතු අත් ආවුද හා උපකරණ පිළිවෙළකට ගබඩා කර ආරක්ෂා කිරීමට භාවිත කළ හැකි පුවරුවක් සාදා ගැනීමට අවශ්‍යව ඇත. මේ සඳහා තෝරාගත් පුවරුවක දළ රූපයක් ද එය සාදා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ ලේඛනයක් ද පුවරුවේ මිනුම් ද පහත දක්වා ඇත.



දළ රූපය

අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ –

- ✳ 1220 mm × 1220 mm ප්‍රමාණයේ තුනී ලෑලි (plywood)
- ✳ 1220 mm × 50 mm × 18 mm ප්‍රමාණයේ තුනී ලෑලි පටි
- ✳ 25 mm × 25 mm කොටු කම්බි දැල
- ✳ සරනේරු යුගල, ඉස්කුරුප්පු ඇණ, කම්බි ඇණ
- ✳ මැනීම, කැපීම, විදීම, සවි කිරීම යන කාර්යන්ට අවශ්‍ය ආවුද හා උපකරණ

(i) මෙම පුවරුවේ ආවුද එල්ලා ගබඩා කළ පසු එක් ආවුදයක් හෝ අස්ථානගත වී ඇත්නම් ඒ බව ක්ෂණිකව දැන ගැනීමට ක්‍රමයක් යෝජනා කර, එම ක්‍රමය පැහැදිලි කරන්න.

(ii) මෙම පුවරුවේ ඇති ආවුද හා උපකරණ ආරක්ෂා කර ගැනීමට ගත හැකි පියවරක් ලෙස, පුවරුවේ දොර වසා ඇති අවස්ථාවලදීත් ඇතුළත දැකිය හැකි දොරක් නිර්මාණය කර ගැනීම සඳහා සැලැස්මක් කොටස් නම් කළ රූපසටහනක් මගින් ඉදිරිපත් කරන්න.

(iii) මෙම ආවුද පුවරුව සෑදීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා අනුපිළිවෙළ පියවර වශයෙන් සඳහන් කර ඒ ඒ පියවරට අවශ්‍ය ආවුද හා උපකරණ කවරේදැයි දක්වන්න.

**3.** මැග්නිටෝ ක්‍රමයෙන් හෝ බැටරියෙන් හෝ විදුලිය ලබා ගන්නා යතුරුපැදිවල එන්ජිම ක්‍රියාත්මක වීම සඳහා පෙට්‍රල්-වාත මිශ්‍රණය දහනය වීමට පුළිඟුවක් ලබා දෙන්නේ පුළිඟු පේනුව මගින් ය.

(i) පුළිඟු පේනුවක් එන්ජිමට සවි කිරීමේදී 'පුළිඟු පේනු යතුර' අවශ්‍ය වන්නේ කුමන අවස්ථාවේදී දැයි පැහැදිලි කරන්න.

(ii) මැග්නිටෝව තුළ විදුලිය උත්පාදනය කිරීමට පාදක වූ 'සිද්ධාන්තය' කෙටියෙන් විස්තර කරන්න.

(iii) පුළිඟු පේනුවේ 'වා හිඩැස' හරහා පුළිඟුවක් ඇති වන්නේ කෙසේදැයි රූපසටහන් සහිතව පැහැදිලි කරන්න.

**4.** කාර්යක් කිරීම සඳහා අවශ්‍ය ශක්තිය උත්පාදනය කිරීමේ සීඝ්‍රතාව හෙවත් ඒකක කාලයක් තුළදී නිපදවනු ලබන ශක්ති ප්‍රමාණය ජවය ලෙස හැඳින්වේ.

(i) ශක්තිය පවතින ආකාර **තුනක්** නම් කරන්න.

(ii) ජවය සම්ප්‍රේෂණය කිරීමට යොදා ගන්නා ක්‍රම **තුනක** රූපසටහන් ඇඳ නම් කරන්න.

(iii) අඩු ආයාසයකින් විශාල භාරයක් චලනය කර ගැනීමට හැකි බව පෙන්වීමට උදාහරණයක් රූපසටහනකින් පැහැදිලි කරන්න. එම රූපසටහනේ කොටස් නම් කරන්න.

**5.** ඝනකම 3 mm වන මෘදු වානේ තහඩු කැබැල්ලකින් රූපයේ දක්වා ඇති බෝතල් මූඩි යතුර සෑදීමට ඔබට පැවරී ඇත.




(i) මෙම කොටස සෑදීමට රූපසටහන් විස්තර තහඩුව මත සලකුණු කර ගැනීමට අවශ්‍ය ආවුද හා උපකරණ නම් කර, එම රේඛා මැකී යාම වැළැක්වීමට කුමක් කළ යුතු දැයි විස්තර කරන්න.

(ii) මෙම කොටසේ ඇති සෘජුකෝණී හතරැස් සිදුර සෑදීමට අවශ්‍ය ආවුද/උපකරණ නම් කර, සිදුර සෑදීමේ කාර්යය පියවර වශයෙන් දක්වන්න.

(iii) මෙම කොටස, දී ඇති මිනුම්වලට හා අදාළ හැඩ සහිතව සාදාගත් පසු එහි නිමාව ඔප මට්ටම් සහිතව නිම කිරීම සඳහා ඔබ අනුගමනය කරන නිමහම් ක්‍රමය කෙටියෙන් විස්තර කරන්න.

**6.** අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත විශ්ව විද්‍යාලීය අධ්‍යාපනයට පිවිසීම අහිමි වන සිසුන්ට වෘත්තීය අධ්‍යාපනය හරහා උසස් අධ්‍යාපනයට පිවිසීමට දොරටු විවෘතව ඇත.

(i) ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) යනු කුමක්දැයි කෙටියෙන් දක්වන්න.

(ii) වෘත්තීය පාඨමාලාවක් තෝරාගැනීමේදී තෝරාගත් පාඨමාලාව හා පුහුණු ආයතනය පිළිබඳව සොයා බැලිය යුතු කරුණු **දෙක** මොනවා ද? කෙටියෙන් විස්තර කරන්න.

(iii) ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් හත (7) ට ඒ ඒ මට්ටම් අනුව අදාළ වන කාණ්ඩ නම් කර දක්වන්න.

**7.** ලෝහ කොටස් එකට සම්බන්ධ කිරීමේදී බහුලව භාවිත වන ක්‍රමයක් ලෙස 'විද්‍යුත් චාප වෙල්ඩින්' ක්‍රමය හැඳින්විය හැකි ය.

(i) විද්‍යුත් චාප වෙල්ඩින් ක්‍රමයේදී අනතුරු සිදු විය හැකි ක්‍රම **තුනක්** සඳහන් කරන්න.

(ii) විද්‍යුත් චාප වෙල්ඩින් ක්‍රමයේදී භාවිත වන මූලික උපකරණ **පහක්** නම් කරන්න.

(iii) විද්‍යුත් චාප වෙල්ඩින් ක්‍රියාවලියේදී වෙල්ඩින් කරන ස්ථානයට තාපය ජනනය වන ආකාරය පැහැදිලි කරන්න.

***

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

# 11 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට



Rs : 300



Rs : 300



Rs : 300



Rs : 300



Rs : 300



Rs : 300



Rs : 350



Rs : 300



Rs : 300



Rs : 200



Rs : 200



Rs : 200



Rs : 250



Rs : 250



Rs : 200



Rs : 200



Rs : 200



Rs : 300



Rs : 300



Rs : 200



Rs : 200



Rs : 250



Rs : 650

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE

## 11 ශ්‍රේණි ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් ENGLISH MEDIAM SHORT NOTE BOOKS Rs 180/-




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE